# ඔයිල් පාම් බෝගයේ තිත්ත පැත්ත

එල්.එම්.කේ. තිලකරත්න

පසුගිය කාලය තුල නොයෙකුත් මාධ්‍ය ප්‍රචාර ඔස්සේ සහස්‍රයේ භෝගය හෙවත් ස්වර්ණමය භෝගය ලෙස හඳුන්වා දෙන ලද ඔයිල් පාම් හෙවත් කටුපොල් වගාවෙන් රටේ ආර්ථිකයට සාමාජිය වාතාවරණයට හා පරිසරයට සිදුවන හානිය පිළිබඳ 2002/04/04 දින ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමය මගින් සංවිධානය කරන ලද ඔයිල් පාම් වගාව පිළිබඳ සම්මන්ත්‍රණයේදී හෙලිවූ තාක්ෂණික කරුණු පහත සඳහන් වේ. මෙම සම්මන්ත්‍රණයේදී ශ්‍රී ලංකා පොල් පර්යේෂණායතනයේ සභාපති ආචාර්ය වෛද්‍යනාථ් මහතා වටවල වැවිලි සමාගමේ පරිපාලන අධ්‍යක්ෂ එස්. සිවකුමාර මහතා විශ්‍රාමලත් පාංශු රසායන පිළිබඳ මහාචාර්ය සී. පානබොක්කේ මහතා සහ ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනයේ අධ්‍යක්ෂ ආචාර්ය එල්.එම්.කේ. තිලකරත්න මහතාත් දේශණ පවත්වන ලදි.

මෙම සම්මන්ත්‍රණයෙන් අනතුරුව පවත්වන ලද සාකච්ඡා වාරයට ප්‍රවීන විද්‍යාඥයින් වූ ශ්‍රී ලංකා පොල් පර්යේෂණායතනයේ හිටපු අධ්‍යක්ෂ ආචාර්ය යූ. පෙතියාගොඩ මහතාත් ලංකා ආයෝජන මණ්ඩලයේ අධ්‍යක්ෂ (පර්යේෂණ) ආචාර්ය නිහාල් සමරප්පුලි මහතාත් රබර් පර්ෂදයේ උපදේශක ලක්නා පරණවිතාන මහතාත්, පාරිසරික පදනමේ ආචාර්ය ඩී.සී. කොඩිතුවක්කු මහත්මියත් ජ්‍යෙෂ්ඨ වැවිලි කළමනාකරුවෙකු වූ මැල්කම් පිරිස් මහතාත් විශේෂ ආරාධිතයන් ලෙස සහභාගි විය.

මෙහිදී හෙලිවූ විද්‍යාත්මක තොරතුරු අනුව රබර් කර්මාන්තය සිය වසකට නොඅඩු කාලයක් ලංකාවේ ප්‍රචලිතව පැවැති ශ්‍රී ලාංකික ජන ජිවිතයට හා සමාජ තත්ත්වයනට ඉතා සමීපව බැඳි ඇති කර්මාන්තයක් බව අවධාරනය කරන ලදි. එබැවින් ප්‍රධාන රබර් වවන ප්‍රදේශයක්වූ දකුණු පලාතේ රබර් වගාව වෙනත් භෝගයකින් විස්ථාපනය කරනු ලැබීමට පෙර එම වෙනස් කිරීම හේතුවෙන් පැන නැඟිය හැකි ආර්ථික පමණක් නොව සාමාජිය හා පාරිසරක පැත්තද හොඳින් අධ්‍යයනය කල යුතු බව අවධාරණය කෙරින. එසේ නොකොට හුදෙක් රුපියල් සත ලාභය පමණක් සලකා රබර් වගාව කටුපොල් මගින් විස්ථාපනය කලහොත් දකුණු පලාතද තවත් හම්බන්තොට දිස්ත්‍රික්කයක් විමට හැකි බවද අනාවරණය විය. තවද, රබර් හා රබර් ආශ්‍රිත නිෂ්පාදන අලෙවියෙන් ශ්‍රී ලංකාව වසරකට රුපියල් බිලියන 24 කට නොඅඩු විනිමය ප්‍රමාණයක් ලබන බවද, රබර් වගාව ආශ්‍රිතව සෘජුව හා වක්‍රව රැකියා ලක්ෂ 21/2 පමණ ලාංකික ජනතාවට ලබාදෙන බවද අනාවරණය විය.

මෙම සම්මන්ත්‍රණයේදී පෙන්වාදෙන ලද තවත් වැදගත් කරුණක් වූයේ අද දිනද තායිලන්තය ඉන්දියාව හා වියට්නාමය වැනි රබර් නිපදවන රටවල ඉතා ජනප්‍රිය භෝග වගාව වනුයේ රබර් වගාවයි. ඊට ප්‍රධාන හේතුව නම්, එම රටවල රබර් ක්ෂේත්‍රයේ ඵලදායිතාව කාර්යක්ෂම පාලනය මගින් වසරකට හෙක්ටයාරයකට කි.ග්‍රෑ. 1500 ට නොඅඩුව පවත්වාගෙන යාමයි. එහෙත් ශ්‍රී ලංකාවේ සමාගම් මගින් පාලනය වන වතුවල ඵලදායිතාවය මින් අඩකට පමණ සීමා වීම ලංකාවේ රබර් වල නිෂ්පාදන වියදම ඉතා ඉහල යාමට හේතුවන බවත් එහෙයින් අද ශ්‍රී ලංකාවේ රබර් වතු පාඩුවට පවත්වාගෙන යන බවත් පැහැදිලි විය. එහෙත් ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනය යටතේ පාලනය වන සාමාන්‍ය තත්ත්වයේ

වත්තක් වූ ඩාර්ටන්ෆිල්ඩ් වතුයායේ අස්වනු දත්ත මගින් පැහැදිලිව පෙන්වා දෙන ලද්දේ නව තාක්ෂණික ක්‍රම උපයෝගීත්වයෙන් අද පවා කිසිදු රබර් වත්තක් පාඩු නොලබා පවත්වාගෙන යා හැකි බවය.

අද කටුපොල් වගා කිරීම සිඝ්‍රයෙන් පෙළඹී ඇති දකුණු පලාතේ ඇති නාකියාදෙණිය වතුයාය ලංකාවේ කීර්තියක් ලබා ඇති උසස්ම තත්වයේ සහ විශාලම වතුයාය වන අතර එහි රබර් කර්මාන්තශාලාවද නවීකරනය කරන ලද මෙට්‍රික් ටොන් 07 පමණ ධාරිතාවයකින් යුතු අනර්ඝතම රබර් කර්මාන්තශාලාවකි. එහෙත් පසුව එය අත්හැර දැමීමේ හේතුවෙන් මෙම වතුයායේ සහ කර්මාන්තශාලාවේ අද තත්වය ඊට බොහෝසෙයින් වෙනස්ව ඇත.

තවද පසුගිය දිනෙක පුවත්පත් වාර්තාවක් මගින් පෙන්වා දුන් පරිදි මෙම වතුයායේ නිෂ්පාදන වියදම කිලෝ ග්‍රෑමයකට රු.78.00ක් වීමට හේතුවද ඉහත කී කරුණු වන අතර මෙම නිෂ්පාදන වියදමින් රු.30/- නොඅඩු ප්‍රමාණයක් වනුයේ එම වතු සමාගම් කොළඹ කාර්යාල පවත්වාගැනීම වැනි කාර්ය සඳහා වැය වන පොදු වියදම් සඳහාය. එහෙත් ඩාර්ටන්ෆිල්ඩ් වතුයායේ නිෂ්පාදන වියදම් සමඟ සසඳන විට මෙම අමතර රු.30.00 අත්හැරුනවිට එම වතුයායේදි නිපදවන සෑම රබර් කිලෝග්‍රෑමයකටම රු.3.00 ට ආසන්න ලාභයක් අදද වාර්තාකල හැකි බව පෙන්වා දෙන ලදි.

මෙම වතු සමාගම් වල රබර් සඳහා අඩු ඵලදායිතාවයට ප්‍රධානම හේතුව නම් එම සමාගම් කිරි කපනා පරිනත රබර් සඳහා පොහොර නොයෙදීම බව පැහැදිලි කරුණකි. එසේනම් පොල් පර්යේෂණායතනය විසින් සඳහන් කර ඇති කිලෝ ග්‍රෑමයට රු.1.50 ලාභ ලබන කටුපොල් සඳහා ඊට දහගුණයක් පමණ වැඩි මිලක විශාල පොහොර ප්‍රමාණයක් යොදන්නේ කෙසේද යන ප්‍රශ්නය අසන ලදි. දැනට පොල් පර්යේෂණායතනය මගින් නිර්දේශ කර ඇති කටුපොල් පොහොර මිශ්‍රනයේ නයිට්‍රජන් අවශ්‍යතාව රබර් වල මෙන් අට ගුණයකින්ද, පොස්පරස් අවශ්‍යතාව රබර් වල මෙන් නව ගුණයකින්ද, පොටෑසියම් අවශ්‍යතාව රබර් වල මෙන් 17 ගුනයක්ද වන බවද දේශකයින් විසින් පැහැදිලිව පෙන්වා දෙන ලදි.

මෙම කරුණට ආදාලව රබර් හා බැඳුනු වටිනාම ගතිගුණය නම් රබර් වගාවෙදි ඵලය ලෙස රබර් අස්වැන්න එකතු කිරීමේදි පසෙහි ඇති වටිනා පෝෂක ද්‍රව්‍ය ක්ෂේත්‍රයෙන් ඉවත් නොකිරීමයි. එහෙත් කටුපොල් ඵලය මගින් පසෙහි ඇති වටිනා පෝෂක වූ නයිට්‍රජන්, පොස්පරස් හා පොටෑසියම් විශාල ප්‍රමාණ වලින් ඉවත් කරනු ලබයි. තවද අද ලෝකයේ කාගෙත් අවධානයට යොමුව ඇති "පිරිසිදු සංවර්ධන පරිපාලනය" ක්‍රමයට අනුව වායුගෝලීය උෂ්ණත්වය වැඩිකිරීම හේතුවෙන් කාබන් ඩයොක්සයිඩ් වායුව, වායුගෝලයෙන් ඉවත් කරගැනීමේ වැඩිම හැකියාවක් ඇත්තේ රබර් ශාකයටය. එබැවින් නොබෝ දිනකින් කියෝටෝ ගිවිසුම මගින් අනාගතයේදි බහුවාර්ෂික බෝග සඳහා ගෙවීමට යන වන්දි මුදල් විශාල ප්‍රමාණයක් රබර් වගාව සඳහා ලබාගත හැකි බව විද්‍යාඥයින්ගේ මතයයි. එමගින් දැනටම ඉන්දුනීසියාවට රබර් වන වගාව උදෙසා ජපානයෙන් විශාල විනිමය සම්භාරයක් ගෙවනු ලබයි. කෙසේවුවද කිසිම කටයුත්තක් සඳහා දැනට ප්‍රයෝජනයක් ගත නොහැකිවූ කටුපොල් කඳන් විනාශ කර දැමීමට ඇති එකම මඟ ගිනි තැබීම බැවින් එසේ කිරීමෙන් එමගින් වායුගෝලයට විශාල ප්‍රමාණයක් කාබන්ඩයොක්සයිඩ් වායුව නැවත නිදහස් කිරීම සිදු කෙරෙන අතර එබැවින් කටුපොල් වගාව මෙම මුදල් ලැබීමට සුදුසුකම් නොලබති.

මෙසේ නොකොට එම කඳන් වත්තෙහි ගොඩගසා දිරාපත්වීමට හැරීමෙන් විශාල වශයෙන් රතු පොල් කුරුමිණියන් බෝවීම සිදුවන බවද විද්‍යාඥයින් විසින් පැහැදිලිව පෙන්වා දි ඇත. මැලේසියාවේ

පොල් වගාව ඉතාම පහත් තත්වයකට පත් වීමට ප්‍රධාන හේතුව වී ඇත්තේ මෙය බවද අනාවරනය වී ඇත. එහෙයින් මෙම කරුණ මත පොල් පර්යේෂනායතනය වඩාත් ප්‍රවේසම් විය යුත්තේ කටුපොල් වගාව තදින් ව්‍යාප්ත කලහොත් එමගින් දකුණේ පොල් වගාව විනාශවී යා හැකි බැවිනි.

තවද මෙම සම්මන්ත්‍රනයේදි මතුවූ ඉතා වැදගත් කාරණාවක් නම් කටුපොල් වගාව මගින් උත්ස්වේදනය කරනු ලබන ඉතා වැඩි ජල වාෂ්ප ප්‍රමාණය හේතුවෙන් පොලව වියලීමට ඇති හැකියාවයි. රබර් වගාව මහින් තෙත් මාස වලදි වසරකදි හෙක්ටයාරයට ජලය ලීටර් 45,000 පමණ උත්ස්වේදනය මගින් පිටකර හරිනු ලබන අතර ඊට සාපේක්ෂකව කටුපොල් මගින් වසරකදි හෙක්ටයාරයට ජලය ලීටර් 55,000 උත්ස්වේදනය මහින් පිටකර හරී. එපමණක් නොව රබර් ගසට ආවේනික තෙතමනය සංරක්ෂණය කරගැනීමේ හැකියාව අනුව වියලි මාස වලදි එමගින් උත්ස්වේදනය කරනු ලබන ජල වාෂ්ප ප්‍රමාණය වසරකදි හෙක්ටයාරයකට ලීටර් 25,000 දක්වා අඩුකර ගනී. නමුත් වියලි මාස වලදි කටුපොල් වගාව මගින් වැඩි සීඝ්‍රතාවයකින් ජලය වාෂ්ප කිරීම හේතුවෙන් වසරකදි හෙක්ටයාරයට ජලය ලීටර් 72,000 පමණ උත්ස්වේදනය කිරීම පාරිසරික වශයෙන් සැලකිය යුතු වැදගත් කරුණක් වන බවය.

රබර් දැව කර්මාන්තය

රබර් ගසින් ප්‍රධාන ඵලය වියලි රබර් නොව රබර් දැව බව මැලේසියාව දැනටම හඳුනාගෙන ඇත. ඊට හේතුව රබර් දැව පදම් කර නිපද වූ භාණ්ඩ වලින් පමණක් මැලේසියාවේ 2000 වසරේ ඩොලර් බිලියන 11.2 ආදායමක් ලබා තිබීමයි. මුළු රබර් කර්මාන්තයෙන්ම ඔවුන් උපයා ඇති මුදලද මේ හා සමාන වේ. එබැවින් දකුණු ආසියාවේ මූල්‍ය කඩා වැටීම හේතුවෙන් ඇතිවූ උද්ධමනය හේතු කර ගෙන නවතා දමා ඇති රබර් දැව කර්මාන්තයද නැවත පණ ගැන්වීමෙන් රටට විශාල විදේශ විනිමයක් උපයා ගත හැකි බවද සම්මන්ත්‍රණයේදි පෙන්වා දෙන ලදි. මෙම කර්මාන්තය සඳහා අවශ්‍ය වනුයේ රබර් ගසින් ලබා ගන්නා සම්පූර්ණ දැව ප්‍රමාණයෙන් 15% - 20% ත් පමණි. ඉතිරි ප්‍රමාණයෙන් 43% දැනට භාවිතා වනුයේ තේ වේලීම සඳහාත් පාරම්පරික පාන්, හුණු, ගඩොල් හා උළු පෝරණු වලට ඉන්දන සඳහාත්ය. පාන්වල නියම රස ලබා ගත ගැනීම සඳහා විකල්ප ඉන්දන භාවිතා කල නොහැකි බව බේකරි කරුවන්ගේ මතයයි. අද ආසියාවේ වැඩිම විදුලි ඒකක මිලක් ඇත්තේ ශ්‍රී ලංකාවේ නිසා අනෙකුත් කර්මාන්ත වලදි ද විදුලි බලය යොදා ගැනීම කිසිසේත් කල නොහැක.

මෙම කර්මාන්ත සඳහා රබර් දැව නොතිබුනහොත් ඒ සඳහා ඇති එකම විකල්පය දැනට ලංකාවේ ඉතිරිව ඇති 18% වූ රක්ෂිත වනය පාලු කර දරට ගැනීමයි. මෙය අනුමත කල හැකි විකල්පයක් දැයි පරිසර විද්‍යාඥයින්ගේ විමසුමට ලක්විය. ඒ හැරුණු විට පරිසරය විද්‍යාඥයින් කටුපොල් වගාව මගින් පරිසරයට හානි පැමිනේ යන මතයට එල්බ ඇත්තේ හුදෙක්ම කටුපොල් ගසින් උත්ස්වේදනය කරනු ලබන ජලය පමණක් සැලකීමට ගැනීමෙන් නොවන බවද අවධාරනය කෙරින.

රබර් භාණ්ඩ නිෂ්පාදනය

මෙම සම්මන්ත්‍රණයේ සාකච්ජා වාරයේදි ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල හා රබර් පර්ෂදයේ විද්‍යාඥයන් විසින් පැහැදිලිව පෙන්වා දෙන ලද්දේ දැනට දියුණු වූ යුරෝපයේ සිට දියුණු වන ආසියාකරය දෙසට ගලා එන රබර් භාණ්ඩ කර්මාන්ත සඳහා අවශ්‍ය රබර් ලංකාවේ නිපදවීමට නොහැකි වුවොත් ආනයනය කල රබර් මගින් එම කාර්ය කල නොහැකි බවයි. ඊට හේතුව ආසියාවේ රබර් මිල

නුදුරු අනාගතයේදී ඉතා ඉහල යන බවයි. එබැවින් ඔවුන් විසින් නගන ලද ප්‍රධාන ප්‍රශ්නය නම් කි.ග්‍රෑ. එකකට රු.350.00 අගය ආදේශ කල හැකි රබර් කර්මාන්තය නැංවීම සඳහා මුදල් ආයෝජනය නොකොට කටුපොල් වැවීම වැනි පටු ආකල්පනයට එළඹීමට වැවිලි සමාගම් යොමු වීමට හේතුව කුමක්ද යන්නයි. මෙහිදී ඔවුන් විසින් අවධාරනය කරන ලද්දේ නුදුරු අනාගතයේ ලංකාවේ රබර් කර්මාන්තයට අවශ්‍ය රබර් මෙරටේ නොනිපදවුවහොත් දැනට මෙහි ආයෝජනය කර ඇති විදේශ සමාගම් තම කර්මාන්තශාලා වසා දමා ඒවා ආසියාවේ අනෙක් රටවල් කරා ගෙන යා හැකි බවය.

මීට ඉහත මැලේසියාව කටුපොල් වගාව සඳහා සීඝ්‍රයෙන් එළඹුනද ඔවුන් එමගින් කරන ලද අණුවන කම් වටහා ගෙන දැන් කටුපොල් ඉඩම් වල නැවත රබර් වගා කිරීම සඳහා හෙක්ටයාරයකට මැලේසියානු ඩොලර් 100 කින් වැඩි සහනාධාරයක් ගෙවනු ලබයි. තවද රබර් වගාව නැවත ප්‍රචලිත කිරීම සඳහා ඉතා මෑතකදී මැලේසියානු අමාත්‍ය මණ්ඩලය මගින් නියෝජ්‍ය අගමැතිතුමා ගේ ප්‍රධානත්වයෙන් හා ඇමතිවරු හතර දෙනෙකු ගෙන් යුත් අධි බලතල ඇති කමිටුවක්ද පත් කර ඇත. මේ සඳහා මැලේසියානු රජය විසින් මැලේසියානු ඩොලර් මිලියන 700 වෙන් කර ඇත. කරුණු මෙසේ පැවතියද ශ්‍රී ලංකාවද මැලේසියාව අනුව යමින් අනාගතය ආලෝකවත් වූ රබර් කර්මාන්ත කරා යොමුවනු වෙනුවට සීඝ්‍රයෙන් ලෝක වෙළඳපොලේ මිල පහත වැටෙමින් පවතින කටුපොල් වගාවට යොමුවීම කිසිසේත් නිර්දේශ කල හැකිද යන්න කාගේත් අවධානයට යොමුවිය.

කටුපොල් බෝගයෙන් ලබා ගන්නා බොර පාම්තෙල් රෙදි සෝදන සබන් වලට හැර කිසිදු කර්මාන්තයකට නුසුදු විෂ සහිත තෙල් වර්ගයක් බව යුනිලිවර් සමාගමේ නිෂ්පාදන විශේෂඥයින් විසින් මෙහිදී පෙන්වා දෙන ලද අතර රෙදි සෝදන සබන් සඳහාද භාවිතා කල හැක්කේ 3% පමණ සුලු බොර තෙල් ප්‍රමාණයක් බවද ඔහු විසින් සඳහන් කරන ලදි. තවද ඉහත කී බොර පාම්තෙල් ආහාර සහ සුවඳ සබන් නිෂ්පාදනය සඳහා යොදා ගැනීමට පිරිපහදු කිරීම ඉතා මිල අධික කාර්යයක් බව සඳහන් කරන ලද අතර මේ සඳහා රු.මිලියන 300 පමණ ආයෝජනය කිරීමට සිදුවන බවද අනාවරනය විය. එහෙත් පාම් තෙල් නිෂ්පාදනයට අවතීර්ණව ඇති සමාගම් මෙහිදී සඳහන් කරන ලද්දේ ඔවුන් තවම එම අදියරට යාමට සැලසුම් කර නොමැති බවය. කරුණු මෙසේ හෙයින් නුදුරු අනාගතයේදී නිපදවනු ලබන බොර පාම්තෙල් යොදාගත හැක්කේ කුමක් සඳහාද යන්න තවම සැලසුම් කර නැත.

පාම්ඔයිල් නිෂ්පාදනයේදී සිදුවන ඉතා විශාල පරිසර දූෂණය පිළිබඳවත් එය වලක්වා ගැනීමට ආයෝජනය කල යුතු විශාල මුදල් පිළිබඳවත් පාරිසරික විද්‍යාඥයින් විසින් බොහෝ ප්‍රශ්න නඟන ලදි. එබැවින් ලංකාවේ රබර් වගාවට වර්ෂාවෙන් අවම බලපෑමක් ඇති හොඳම රබර් නිපදවන ප්‍රදේශයක් වන දකුණු පළාතේ රබර් වගාව විනාශ කර දැමීම ආර්ථික වශයෙන්ද සාමාජීය වශයෙන්ද පාරිසරික වශයෙන්ද කෙතරම් අණුවන ක්‍රියාවක්දැයි කාගෙත් අවධානයට ලක්විය.

කටුපොල් වගාව දකුණු පළාතේ ප්‍රචලිත කිරීමට සුභවාදිව වාර්තාවක් ඉදිරිපත් කර ඇති පොල් පර්යේෂණායතනය මෙහිදී සඳහන් කරන ලද්දේ ඔවුන් විසින් කටුපොල් වගාකර ඇති ප්‍රදේශ වල දෙදිනක සංචාරයකින් පිළියල කරන ලද අතුරු සමීක්ෂණ වාර්තාව සත්‍යතා වාර්තාවක් ලෙස වරදවා වටහාගෙන මෙම වතු සමාගම් හා වගකිවයුත්තන් කටයුතු කර ඇති බවය. එබැවින් මෙහිදී තීරණය වූයේ මෙම නොමඟ යවන සුළු අතුරු සමීක්ෂන වාර්තාව ඉවතලා ඒ වෙනුවට ඉතා පරීක්ෂාවෙන් පිළියෙල කරනු ලබන පූර්ව සත්‍යතා වාර්තාවක් මගින් මේ පිළිබඳව ඉතා ප්‍රවේසමෙන් අධ්‍යයනය කල යුතු බවත් ඒ සඳහා රබර් පර්යේෂණායනයේ නිලධාරීන් ඇතුළු අනෙකුත් විද්‍යාඥයින් සම්බන්ධ කරගත යුතු බවත් ය.